# පනස්හයේ දරුවෝ
## (දෙවැනි කොටස)

මධ්‍ය මහා විද්‍යාලවලින් බටහිර අධ්‍යාපනයක් ලබාගත් හා ලබාගන්නා ගැමි තරුණයන්ට බටහිර මතවාදවල ඇලී ගැලී දිනාගත හැකි නිදහසක් නොමැත. ඇතැම් අමන ඇංකරයන්ට නොතේරුණ ද, නොතේරීම නිසා ම ඔවුන්ට හිනාගිය ද, මෙරට පාසල් අධ්‍යාපනයේ බටහිර ක්‍රිස්තියානි ගැති බව පිම්මේ වැඩිවන්නෙට පටන්ගන්නේ උසස් පෙළ පංතිවල ය. උසස් පෙළ යනු රටට වැඩක් නැති අනුකාරකයන් බිහි කිරීම සඳහා යොදාගන්නා ප්‍රධාන ම පංතිය වෙයි. විශ්ව විද්‍යාලයේ දී මේ තත්ත්වය තවත් වර්ධනය කෙරෙයි. මේ අධ්‍යාපනයෙන් පමණක් බිහිවන ගැමි හෝ නගරබද හෝ කිසිම තරුණයකුට හෝ තරුණියකට හෝ රටේ අනාගතය භාරදීම අති භයානක කාර්යයකි. ආගම්වලට හැරවීම ගැන පක්ෂව මෙන් ම විපක්ෂව ද කතා කරන බොහෝ දෙනා තේරුම් නොගන්නා කරුණක් නම් අධ්‍යාපනය මගින් වෙනත් සංස්කෘතියකට හැරවීම ය. කෙසේ වෙතත්, මෙරට ගැමි තරුණයන්ට (ඔවුන් ගම්වල වාසය කිරීම අනිවාර්ය නොවේ.) අවුරුදු දහඅටක පමණ කාලයක් තිස්සේ ලැබෙන වෙනත් අධ්‍යාපනයක් හේතුකොටගෙන වෙන ම තත්ත්වයක් උදා වී ඇත. ගුණදාස අමරසේකර මහතා ද ඒ අධ්‍යාපනය ලබා දීමට දායක වෙයි. මෙරට විමුක්තිය අත්පත් කර ගත හැක්කේ මේ නව අධ්‍යාපනයෙන් බිහිවන්නන්ට ය. ශ්‍රී ල නි පක්ෂයේ හා ජ වි පෙරමුණේ මෙන් ම වෙනත් පනස්හයේ දරුවන්ට ද මේ අධ්‍යාපනය උරුම වෙයි. අපට බටහිර යටත්විජිතවාදයට එරෙහි ව බටහිර මතවාද යොදා ගනිමින් ක්‍රියාකර ජයක් අත්පත් කරගත නොහැකි ය. බටහිරයන් බිහිකල මාක්ස්වාදය බටහිරයෝ යොදා නොගත්හ. එය අනෙක් රටවල ඊනියා විමුක්තියක් වෙනුවෙන් අපනයනය කෙරිණි.

අපට ජයග්‍රහණය කළ හැක්කේ ද, සැබෑ නිදහසක් දිනාගත හැක්කේ ද බටහිර මතවාදවලින් නිදහස් වීමෙනි පනස්හයේ දරුවන්ට අඩුපාඩුවක් ව තිබුණේ අපේ මතවාද (මතවාද හා ප්‍රවාද යනුවෙන් දෙකක් නැති බව අපේ ප්‍රවාදයෙහි වෙයි) නැති කම ය. අපි ඒ නිර්මාණය කරන්නෙමු. පනස්හයේ දරුවන්ට ජයග්‍රහණය කළ හැකි ය. ඒ ජයග්‍රහණය මෙරට සිංහල බෞද්ධයන්ගේ පමණක් නොව බටහිර සංස්කෘතික ආර්ථික දේශපාලන යටත්විජිතවාදයට එරෙහි සියල්ලන්ගේ ම ජයග්‍රහණයක් වනු ඇත. අවුරුදු දහඅටක පමණ කාලයක් තිස්සේ වර්ධනය වී ඇති මේ නව අධ්‍යාපනය මගින් බටහිර ඉතිහාසය තේරුම් ගැනෙන්නේ පහත සඳහන් ආකාරයට ය.

ඉතා සැකෙවින් ගතහොත් බු.ව.2000 පමණ (ක්‍රි. ව. 1460 පමණ) සිට ලෝකයේ සිදු වී ඇත්තේ කුමක් ද? එකල යුරෝපයේ නව චින්තනයක් ඇති වීම ඇරඹුනි. එයට හේතු වූයේ අරාබීන් ඔස්සේ එයට කලින් වසර දෙසියක පමණ කාලයක් තිස්සේ ආසියාවෙන් යුරෝපයට ගලා ගිය දැනුම ය. කොපර්නිකස්ලා ගැන බටහිරයන් කියන ගප්බින්න කෙසේ වුව ද පෘථිවිය සූර්යයා වටේ යන බව ආදි භාරතීයයෝ දැන සිටියහ. එහෙත් යුරෝපීයයන් මේ දැනුම ආසියාවෙන් ලබා ගත්තේ අනුකරණයෙන් නොව යුදෙව් ක්‍රිස්තියානි චින්තනය හා ග්‍රීක චින්තනය මුසුකර තනාගත් නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අවශෝෂණය කිරීමෙනි. (ඇතැම්මු මේ කරුණ අමතක කරති. ඔවුන් උජාරුවෙන් කියන්නේ බටහිරයන් දැනගත් බොහෝ දේ ආසියාතිකයන් එයට කලින් දැන සිටි බව ය. එය නිවැරදි නොවේ. ආසියාවෙන් ලබාගත් දැනුම යුරෝපීය කිරීමට බටහිරයන්ට හැකි විය.) මුල දී මේ චින්තනය බිහි වූයේ කතෝලික චින්තනයක් තිබූ ඉතාලිය වැනි රටවල හා ග්‍රීක ඕතොඩොක්ස් චින්තනයක් තිබූ නැගෙනහිර යුරෝපීය රටවල ය. ටයිකො බ්‍රාහෙ, කෙප්ලර්, කොපර්නිකස්, ගැලීලියෝ ආදීන් පමණක් නොව ලෙනාඩෝ ඩාවින්චිලා ද මිචලාංජිලෝලා ද මේ චින්තනය බිහි කිරීමට දායක වූහ. ඔවුන් සියල්ලන් ම කතෝලික වූ බව ද අමතක නොකළ යුතු ය. කතෝලික වුව ද ඔවුහු කතෝලික චින්තනයට විරුද්ධ චින්තනයක් බිහි කිරීමට අවිඥානික ව කටයුතු කළහ. කැල්වින් හා මාටින් ලූතර් චින්තන විප්ලවයට සහභාගි වූ ප්‍රසිද්ධ පූජකවරු වූහ. මේ චින්තනය විසින් ප්‍රොතෙස්තන්ත ආගම කතෝලික ආගමට විරුද්ධ ව බිහි කෙරිණි. මැක්ස් වෙබර් නම් සමාජ විද්‍යාඥයා ද ප්‍රොටෙස්ටන්ට් එතික් නම් පොතෙහි සාකච්ඡා කරන්නේ මේ චින්තනයේ ඇතැම් ආකල්ප හා දර්ශනය පිළිබඳ ව ය. වෙබර් පඬිවරයාට චින්තනය නම් සංකල්පය නොතිබුණු බැව් මෙරට සිටින බටහිර සමාජ විද්‍යාඥයන් වුව ද දන්නා කරුණක් විය යුතු ය. එහෙත් ඔහු ප්‍රොතෙස්තන්ත යුරෝපයේ සිදු වූ වෙනසත් ධනවාදය බටහිර යුරෝපයේ ඇතිවීමට හේතුවත් සාකච්ඡා කෙළේ ය.

© Prof. Nalin De Silva

ධනවාදය පමණක් නොව බටහිර විද්‍යාව හා තාක්‍ෂණය ද බිහි වූයේ මූලික වශයෙන් ගත්කල මේ චින්තනයෙහි ය. මාක්ස්වාදී බේගල් කෙසේ වෙතත් බටහිර විද්‍යාව හා තාක්‍ෂණය නොවන්නට ධනවාදය බිහිනොවීමට තිබුණි. බටහිර විද්‍යාව ධනවාදයේ ප්‍රතිඵලයක් ලෙස සැලකීම ඇතැම් නිර්මාක්ස්වාදීන් අතින් ද සිදුවන්නකි. එහෙත් එය වැරදි ය. කෙප්ලර්ලා පමණක් නොව නිව්ටන්ලා ද ජීවත්වූයේ ධනවාදය ඇති වීමට පෙර ය. බටහිර නූතනත්වය යනු නව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ආර්ථික දේශපාලන හා සංස්කෘතික රටාව ය. මාක්ස්වාදය මේ චින්තනයෙන් කැඩෙන්නට  උත්සාහ කෙළේ ය. එහෙත් එය හෙගල්ගේ දර්ශනය ද සමගින් පැරණි කතෝලික චින්තනය තුළ නිර්මාණය වූවක් විය. ප්‍රංශය ජර්මනිය ආදී බටහිර යුරෝපීය රටවල් කතෝලික රටවල් වෙයි. බටහිර ෆැසිස්ට්වාදය මෙන් ම කොමියුනිස්ට්වාදය ද කතෝලික චින්තනයක බිහි වූ පද්ධති වෙයි. යුරෝපයේ කිසියම් ක්‍රමයකට හෝ කොමියුනිස්ට්වාදී රාජ්‍ය ඇති වූයේ නැගෙනහිර ඔතොඩොක්ස් රටවල හා කතෝලික රටවල මිස ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි රටවල නොවේ. බටහිර යුරෝපයේ වුව ද කතෝලික රටවල් වූ ඉතාලියෙහි හා ප්‍රංශයෙහි කොමියුනිස්ට්වාදය තරමක් පැතිරී ගියේ ය. ෆැසිස්ට්වාදය හේතුවෙන් නිර්මාණය වූ ඊනියා දෙවැනි ලෝක යුද්ධය යනු යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට එරෙහිව කතෝලික චින්තනය විසින් ඇති කරනු ලැබූ අවසන් මහා පරිමාණ දේශපාලන සටන විය හැකි ය. මෙය හිට්ලර්ගේ යුදෙව් විරෝධය ගැන සලකා මතුපිටින් කරන ප්‍රකාශයක් යැයි ඊනියා ප්‍රබුද්ධයකුට කිව හැකි වුව ද, එය එසේ නොවේ. ෆැසිස්ට්වාදය ද ඇති වූයේ කතෝලික ජර්මනියේ හා ඉතාලියේ ය. ඊනියා දෙවැනි ලෝක යුද්ධය, කතෝලික චින්තනය විසින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට එරෙහිව කරන ලද අවසාන මහා පරිමාණ දේශපාලන සටන විය හැකි වුව ද චින්තනයක් ලෙස ගත්කල කතෝලික චින්තනය තවමත් ලෝකයෙහි වෙයි. එහෙත් අද එයට එතරම් වැදගත් තැනක් හිමි නොවෙයි.

පශ්චාත්නූතනත්වය යනුවෙන් ප්‍රපංචයක් මෙරට තබා බටහිරවත් නැත. මෙරට ඇතැයි කියැවෙන ඊනියා උත්තරාරෝපිත පශ්චාත්නූතනත්වය යන්න බටහිරයන් ම තනා එවන තවත් සංකල්පයක් පමණකි. මෙරට ඊනියා පශ්චාත්නූතනත්වය  පමණක් නොව නූතනත්වය හා ධනවාදය ද බටහිරයන්ට හා අනුකාරක ඇංකරයන්ට අනුව උත්තරාරෝපිත ප්‍රපංච වෙයි. මේ ඊනියා උත්තරාරෝපනය යනු අන් කිසිවක් නොව බටහිර ක්‍රිස්තියානි ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික යටත්විජිතවාදය අප මත බලයෙන් පැටවීම ය. එය යටත්විජිතවාදය ලෙස නොහඳුන්වා ඊනියා උත්තරාරෝපිතයක් ලෙස හැඳින්වීම ම බටහිර සමාජයීය විද්‍යාඥයන්ගේ යටත්විජිතවාදී කුහකත්වයට හා ප්‍රෝඩාවට නිදර්ශනයකි. ඔවුහු තම සංස්කෘතිය විසින් ඇතිකර තිබෙන ඇතැම් යටත්විජිතවාදී ප්‍රපංච බොරු සංකල්ප මගින් වසන්කරති. පශ්චාත්නූතනත්වය යනුවෙන් බටහිර සිදුවන්නේ නූතනත්වය ම තවත් වර්ධනය වීමක් පමණකි. ලියෝතාර්ද් මහතා පශ්චාත් නූතනවාදී අවශ්‍යතාවය (පෝස්ට් මොඩර්න් කන්ඩිෂන්) යනුවෙන් ඉදිරිපත් කරන්නේ ඉතා ළාමක අදහස් කිහිපයක් පමණකි.

ෆැසිස්ට්වාදයේ මහා පරිණාම පරාජයෙන් පසු ප්‍රොතෙස්තන්ත ලෝකයේ නායකත්වය බ්‍රිතානියෙන් ඇමරිකාවට මාරු විය. එමෙන් ම බ්‍රිතානි නායකත්වයට කාර්මික විප්ලවය බල පෑ ආකාරයට ඇමරිකන් නායකත්වයට ඊනියා දෙවැනි ලෝක යුද්ධයත් සමග ඇති වූ ඉලෙක්ට්‍රොනික විප්ලවය බල පෑවේ ය. අද බටහිර ආධිපත්‍යය ඇමරිකන් නායකත්වය යටතේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම් කරමින් තව තවත් තහවුරු වෙයි. ඊනියා ගෝලීයකරණය, පෞද්ගලිකකරණය, පරිභෝජනය වැඩිවීම, මහා පරිමාණ නිෂ්පාදනය, කතෝලික චින්තනයේ සමස්තය වෙනුවට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ පුද්ගලිකත්වය හා කෑලිවලට කැඩීම තව තවත් වර්ධනය වීම, මිනිසාගේ පෞද්ගලික නිදහස නාමයෙන් මිනිස් හැඟීම්වලට හා ඉන්ද්‍රිය පිනවීමට ඉඩකඩ සැපයීම, වැලන්ටයින් (සිරස) ප්‍රපංචය හෙවත් මිනිසා සංස්කෘතියෙන් වෙන්කර නැවතත් ප්‍රකෘතියට හැඟීම් වශයෙන් ගෙනයෑම, ස්වභාවය සම්බන්ධයෙන් ගත්කල එහි විරුද්ධය, එනම් ප්‍රකෘතිය නැතිකර දැමීම, ආදිය ඊනියා පශ්චාත්නූතනත්වයක් නොව බටහිර නූතනත්වය තව තවත් වර්ධනය වීමකි. අද ඒ ඒ විෂය තව තවත් කොටස්වලට කැඩෙන්නේත් කුඩා කුඩා ක්ෂේත්‍රවල විශේෂඥයන් බිහිවන්නේත් විසිඑක්වැනි සියවසේ (බු.ව.) ඇරඹි දැනුම විෂයවලට කැඩීම වර්ධනය වීමෙනි. අද බටහිර ඇතැමුන් නවකතාව සමාජ විශ්ලේෂණයෙන් හා මනෝ විශ්ලේෂණයෙන් ඈත්විය යුතු යැයි ප්‍රකාශකරන විට ඉන් කියැවෙන්නේ විසිඑක්වැනි සියවසේ බටහිර යුරෝපීයයන් කලාව විද්‍යාවෙන් වෙන් කර ඇරඹි ගමනක් තව දුරටත් යෑමක් පමණකි.

ඊනියා පිටපත්කරණය හෙවත් විඩම්බනය (සිමියුලේෂන්) යනු ඉහත සඳහන් මහා පරිමාණ නිෂ්පාදනයේ ප්‍රතිඵලයකි. එය අද පාරිභෝගික ද්‍රව්‍යවලට පමණක් සීමාවූවක් නොවේ. අධ්‍යාපනයෙහි ද ඊනියා පර්යේෂණවල ද මෙය දැකිය හැකි

© Prof. Nalin De Silva

ය. (ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි අධ්‍යාපනය ද පරිභෝජනය කළ හැක්කක් බවට පත්වෙයි. එපමණක් නොව මිනිස් ශ්‍රමය ද පාරිභෝජිතයක් වෙයි. මේ චින්තනය අප්‍රාණවාදී වන අතර කතෝලික චින්තනය ප්‍රාණවාදී - ඇනිමිස්ටික් - වෙයි. මිනිසුන් ද සිත් පිත් නැති යන්ත්‍ර බවට මේ චින්තනය විසින් පත්කෙරෙයි.) බටහිර විශ්ව විද්‍යාල බිහිවූයේ කතෝලික චින්තනයෙහි ය. විශ්ව විද්‍යාලයක් (යුනිවර්සිටාස්) යන්නෙහි සමස්තය යන තේරුම වෙයි. විශ්ව විද්‍යාලය යනු පීඨවල ඓන්ද්‍රීය එකතුවෙන් නිර්මාණය වූ ආයතනයකි. පීඨ යන්නට යෙදෙන ඉංගිරිසි වචනය වූ ෆැකල්ටි යන්න ඉන්ද්‍රිය යන තේරුම ගෙන දෙයි. ඉන්ද්‍රිය එකතුවෙන් දැනුම ලැබෙන්නාක් මෙන් පීඨ එකතුවෙන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයනය සිදුවෙයි. එහෙත් බටහිර යුරෝපය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට මාරුවීමත් සමග විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනයෙහි ද වෙනස්කම් සිදුවිණි. අද එය ක්‍රමයෙන් වර්ධනය වී සමස්තය ගිලිහී, පීඨ ඊනියා විශ්ව විද්‍යාල බවට පත් වී ඇත. අධ්‍යාපනය ද පාරිභෝජිතයක් වීමත් සමග එය සමාජයේ ඉහළ තලවලට යෑමට යොදා ගැනෙන ඉණිමඟක් බවට පත්විණි. ඒ සමග අධ්‍යාපනයෙහි බටහිර විද්‍යාව හා ශාස්ත්‍ර වෙනුවට තාක්‍ෂණය ඉදිරියට පැමිණියේ ය. අද බටහිර ද තාක්‍ෂණික විෂයයන්ට හා ඊනියා වෘත්තීය පාඨමාලාවලට ඉල්ලුමක් ඇත්තේ අධ්‍යාපනය පාරිභෝජිතයක් වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් උසස් චින්තකයන් හා දාර්ශනිකයන් එතරම් සංඛ්‍යාවක් කිසි දිනෙක බිහි වී නැතත් ක්‍රිස්තියානි රටවලට කතෝලික හා ඕතොඩොක්ස් යුරෝපයෙන් චින්තකයන් හා දාර්ශනිකයන් මිල දී ගැනීමට හැකි විය. එහෙත් අද මහා පරිමාණයෙන් ඉගැන්වීම, පර්යේෂණ කිරීම, පොත් හා පුවත්පත් පළකිරීම හේතුවෙන් ප්‍රංශයේ හා ජර්මනියේ ද ඩෙරිඩා වැනි චින්තක පිටපත් බිහිවීම ඇරඹී ඇත. මේ නූතනත්වය තවත් වර්ධනය වීමක් පමණකි. ඩෙරිඩා හා ලියෝතාර්ද් බිහිවන්නේ නූතනත්වයේ වර්ධනයෙන් මිස ඊනියා පශ්චාත්නූතනත්වයකින් නොවේ.

අද ලෝකයේ සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳ අපට අපේ ම වූ දැක්මක් ඇත. එහෙත් අනුකාරක ඇංකරයන්ට අනුව නම් අපට ලෝකය ගැන කිසිම දැනුමක් නැත. තම බටහිර ස්වාමීන්ගේ මත වමාරන්නන් හැර අනෙක් අය ඇංකරයන්ට අනුව කිසිවක් නොදන්නා ලිං මැඩියෝ වෙති. ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවලින් නඩත්තු කෙරෙන උගතුන්ට අනුව ජාතික චින්තනයට ඊනියා නූතන ලෝක දැක්මක් පමණක් නොව ජාතික වශයෙන් ගත්කල, සිංහල ජාතියෙන් බාහිර ජනවර්ග සිංහල (ලාංකික) ජාතියට ඇතුල් කරගැනීම පිළිබඳ මතවාදයක් (ප්‍රවාදයක්) නැත. එහෙත් මේ පට්ටපල් බොරුවකි. අද මෙරට ප්‍රශ්නය වී ඇත්තේ දෙමළ, මුස්ලිම් ආදී ජනවර්ගවලට මෙරට ඉතිහාසය හා සංස්කෘතිය පිළිගැන්වීමට සිංහලයන්ට නොහැකි වීම ය. බොහෝ කලකට පෙර මා පෙන්වා දුන්නේ මෙරට බෞද්ධ නොවන්නන් බොහෝ දෙනකුට අනුරාධපුරය තම නගරයක්, ඓතිහාසික භූමියක් ලෙස සිතීමට නොහැකි බව ය. දෙමළ ජනයාට මුළු ලංකාව ම තම නිජ භූමිය ලෙස සිතීමට නොහැකි වී ඇත්තේ එලෙස සිතීමට ඔවුන්ට පුරුදු කෙරී නොමැති බැවිනි. එසේ සිදුවන්නේ සිංහලයන්ගේ බහිෂ්කාර (එක්ස්ක්ලූසිව්), එනම් බැහැර කිරීමේ ප්‍රතිපත්තියක් නිසා නොව සිංහල බෞද්ධ සංස්කෘතියට හා ඉතිහාසයට මෙරට හිමිවිය යුතු තැන හිමි කර දීමට බටහිරයන්ගේ මෙහෙයවීම මත ක්‍රියාකරන පිරිසක් අකමැති වීම හේතුවෙනි. බහිෂ්කාර ප්‍රතිපත්තියක් ඇත්තේ සිංහල බෞද්ධයන්ට නොව අනෙක් කොටස්වල නායකයන්ට ය. පැරණි ඇතැන්ස් නගරය හා රෝමය ඊනියා මානව ඉතිහාසයක නාමයෙන් වැළඳ ගන්නා මොවුන්ට අනුරාධපුරය හා පොළොන්නරුව වැළඳ ගැනීමට නොහැකි ය. ඔවුන්ට පුරුදු කෙරී ඇත්තේ ඒ නගරවලට වෛර කිරීමටත්, ඒ ඉතිහාසය නොපිළිගෙන බොරු දේවානම්පිය තීෂම් හා නෙස්ටෝරියන් කුරුස ඉතිහාස නිර්මාණය කිරීමටත් ය.

පනස්හයේ දරුවන්ට අනුකාරක ඇංකරයන්ගේ වැමෑරීම්වලින් වැඩක් නැත. බටහිර මතවාද වමාර වමාර කෑමට ඇංකරයන්ට ඉඩ දී පනස්හයේ දරුවන් ඇතිකර ගත් සංධානය ශක්තිමත් කර ඉදිරියට ගෙන යෑමට හැකි සෑම උත්සාහයක් ම ගත යුතු ය. එහෙත් එයට බාධා වෙයි. දැනටමත් සංධානයට තර්ජන එල්ල වී ඇත. බටහිරයන් පමණක් නොව ඉන්දියාව ද සන්ධානයට විරුද්ධ වෙයි. බටහිරයන් විරුද්ධවන්නේ ඇයි ද යන්න සිතාගැනීම එතරම් අපහසු නොවේ. පනස්හයේ දරුවන්ගේ සන්ධානය යනු මෙරට ජාතික විමුක්ති අරගලයේ සන්ධානයයි. බටහිර ක්‍රිස්තියානි ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික යටත්විජිතවාදයට විරුද්ධව ඉන් නිදහස් වීමට නිර්මාණය කර ගත් සන්ධානයකට බටහිරයන් විරුද්ධ වීම පුදුමයක් නොවේ. සන්ධානය පිළිබඳ සාකච්ඡා ඇති වූ මුල් කාලයේ දී එවකට ඇමරිකානු තානාපති වූ ඈෂ්ලි විල්ස් අනුර බණ්ඩාරණායක මහතා හමු වී ජ වි පෙ සමග එකතු වීමට විරුද්ධ ව ගතු කී බව අමතක නොකළ යුතු ය.

© Prof. Nalin De Silva

ඉන්දියාව සන්ධානයට විරුද්ධ වන්නේ සන්ධානය හේතුවෙන් කොටින්ට වාසි අත්වේය යන උපකල්පනයෙනි. කොටි එක් පැත්තකින් තව තවත් බටහිරින් මෙහෙයවනු ලැබීමත් අනෙක් පැත්තෙන් දෙමළ ජාතිවාදය අවුස්සමින් තව තවත් දෙමළ ජනයා සිංහලයන්ට විරුද්ධව මෙහෙයවීමත් සන්ධානයේ ප්‍රතිඵල ලෙස සිදුවනු ඇතැයි ඉන්දියාව සිතයි. එමෙන් ම ඉක්මන් මැතිවරණයකට ද ඉන්දියාව අකමැති වෙයි. ඒ එමගින් කොටි නියෝජිතයන් විශාල පිරිසක් පාර්ලිමේන්තුවට තේරී පත්වේවිය යන උපකල්පනයෙනි. කොටි ශක්තිමත්වීම ඉන්දියාවට ප්‍රශ්නයක් වන බැවින් හා සංධානය ඔස්සේ කොටි ශක්තිමත් වේය යන  අදහස ඉන්දියාවට ඇති බැවින් ඉන්දියාව සන්ධානයට විරුද්ධ වෙයි. ඉන්දියාව වැඩකරන්නේ සිංහලයන්ට හෝ ලංකාවට ඇති ආදරයක් නිසා නොව, ඉන්දියාවේ ඕනෑ එපාකම්වලට අනුව ය. සිංහලයාගේ පැත්තෙන් යැයි කියමින් ඉන්දියාවට කරුණු කීමෙන් එතරම් ඵලක් නැත. මැතිවරණය ක්ෂණික ව නොපවත්වා පසුව පැවැත්වුව ද කොටි පාර්ලිමේන්තුවට පැමිණීම වැළැක්විය හැකි නොවේ. කළ යුත්තේ හැකි ඉක්මණින් කොටි විනාශ කිරීම ය. ඒ සඳහා ඉන්දියාවට වැඩ පිළිවෙළක් වේ ද?

අද ඉන්දියාවට මෙන් ම බටහිරට ද, වෙනස් හේතු නිසා වුව ද අවශ්‍ය වන්නේ ශ්‍රී ල නි ප හා එ ජා ප අතර සන්ධානයකි.  මනෝ මලික් සාකච්ඡා ඒ සඳහා ය. කිසිම ජන පදනමක් නොමැති දෙදෙනකු, මා හිතන අයුරින් නම් ඉංගිරිසියෙන්, සාකච්ඡා කරන්නේ ජනතාවට අවශ්‍ය දෙයක් ඉටු කිරීමට නොව බටහිරට හා ඉන්දියාවට අවශ්‍ය දේ කිරීමට ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ප්‍රසිද්ධියේ මොනවා කීව ද සන්ධානයට කැමැත්තක් නොදක්වයි. තවමත් පනස්හයේ දරුවකු නොවන ඇය ක්‍රියාත්මක කරන්නේ පනස්හයේ දරුවන්ට විරුද්ධව පිහිටුවා ගන්නා ලද මහජන පක්ෂයේ ප්‍රතිපත්තිය. ඒ අතර සන්ධානයේ ඇතැමුන්ට සන්ධානය යනු මැතිවරණ දිනීම සඳහා තනාගත් තවත් මෙවලමක් පමණකි. සන්ධානය යනු බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙන් නිදහස්වීම සඳහා තනාගත් එකතුවක් බව මොවුන්ට අමතක වෙයි. මැතිවරණ කෝණයෙන් පමණක් බලන මොවුන්ට එ ජා ප - ශ්‍රී ල නි ප හවුලක් සන්ධානයට වඩා වැදගත් විය හැකි ය. මනෝ මලික් සාකච්ඡා අසාර්ථක කිරීම සඳහා කටයුතු කිරීම සන්ධානයේ වගකීමක් වෙයි. (අයිතිය යන බටහිර සංකල්පය ඉවත දමා සිගාලෝවාද සූත්‍රය ආදර්ශයට ගනිමින් යුතුකම් හා වගකීම් ඇසුරෙන් සමාජ සම්බන්ධතා තේරුම් ගැනීමට අප උත්සාහ ගත යුතු ය.) මනෝ මලික් සාකච්ඡාවල අවසන් ප්‍රතිඵලය වනු ඇත්තේ ශ්‍රී ල නි ප හා එ ජා ප එකතු වී ප්‍රභාකරන්ට රට පාවා දීම ය. රාජ්‍ය නොවන සංවිධාන ඒ වෙනුවෙන් පෙනී සිටියි. ගුවන් විදුලියේ පරිපාලනය වෙනස් වුව ද එයට සවන් දෙන්නන්ට අනුව එහි සිංහල බෞද්ධ විරෝධී වැඩ සටහන්වල වෙනසක් වී නැත. මුදල් ගෙවා ලබාගෙන ඇති සුබාරතී වැඩසටහනෙන් පමණක් නොව වෙනත් වැඩසටහන්වලින්ද ඉඩ ලැබෙන්නේ සිංහල බෞද්ධ විරෝධී මතවලට ය. සුබාරතිය මනෝ මලික් වෙනුවෙන් කඩේ යයි.

දෙමළ ජාතිවාදය පිළිබඳ ප්‍රශ්නයට සන්ධානයටවත් ජාතික මතවාදීන්ටවත් විසඳුමක් නැතැයි අනුකාරක ඇංකරයෝ කියති. මා අනුකාරක ඇංකරයන්ට බැනීම ද රාජ්‍ය නොවන සංවිධානවලින් නඩත්තු වෙන ඇංකරයන්ට ප්‍රශ්නයක් වී ඇත. ඇංකරයන් ඇත්තේ බැනීමට මිස නැලවීමට නොවේ. සිංහලත්වයට එරෙහි වන්නන් ඊනියා සුචරිතයක එල්බ ගෙන නැලවීමට පනස්හයේ දරුවන්ට අවශ්‍ය නොවේ. දෙමළ ජනතාවට දෙමළ වීම නිසා ම ඇති ප්‍රශ්නයක් නොමැති බැවින් විසඳීමට ප්‍රශ්නයක් නොමැත. දෙමළ ජනතාවට කෙසේ වෙතත් දෙමළ ජාතිවාදයට එදා මෙන්ම අද ද ඇත්තේ අභිලාෂයක් මිස සිංහලයන්ගෙන් වී ඇති අසාධාරණයක් නොවේ. බටහිරයන් විසින් මෙහෙයවනු ලබන දෙමළ ජාතිවාදයේ අභිලාෂය උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ට අහිමි කිරීම ය.

දෙමළ ජාතිවාදයේ අභිලාෂය කුමක් වුවත් මධ්‍යයේ පාලනයේ දෙමළ හා මුස්ලිම් නියෝජනත්වයකට සිංහලයෝ අකමැති නොවෙති. මේ බව අප කියා ඇත්තේ අවුරුදු ගණනකට පෙර ය. එහෙත් එහි දී මෙරට සිංහලත්වයට හිමි තැන දෙමළ හා මුස්ලිම් ජනයා පිළිගත යුතු වෙයි. දෙමළ ජාතිවාදී නායකයන් නොවන්නට දෙමළ ජනයා ඒ බව පිළිගනිති. මේ සිංහල බෞද්ධ අධිපතිවාදයක් නොව සිංහල බෞද්ධ සංස්කෘතියේ හා ඉතිහාසයේ සුවිශේෂත්වය පිළිගැනීම ය. බටහිරයන්ගේ ආධිපත්‍යය පිළිගන්නා දෙමළ ජාතිවාදීන්ට මෙරට සිංහල සංස්කෘතියේ සුවිශේෂත්වය පිළිගැනීමට නොහැකි ඇයි? සිංහලයන් විරුද්ධ වන්නේ මධ්‍ය ව්‍යවස්ථාදායකයෙහි දෙමළ මුස්ලිම් නියෝජනත්වයකට නොව පළාත් සභාවලට හෝ වෙනත් එවැනි ආයතනවලට හෝ ව්‍යවස්ථාදායක බලය පැවරීමෙන් හෝ විමධ්‍යගතකිරීමෙන් හෝ රටේ ඒකීය බව නැති කිරීමට ය. පරිපාලනය විමධ්‍යගත කිරීමටත් මධ්‍යයේ පාලනයේ දෙමළ මුස්ලිම් නියෝජනත්වයකටත් සිංහලයෝ විරුද්ධ නොවෙති. වැඩකට නැති පළාත් සභා අහෝසි කර පළාත් සංවර්ධන කමිටු (කාරක සභා) මධ්‍ය ආයතනයේ (පාර්ලිමේන්තුවේ - රාජ්‍ය සභාවේ) ඇති කර හැකි ය. මේ පළාත් සුද්දන් විසින්

© Prof. Nalin De Silva

ඇතිකරන ලද පළාත් නොවිය යුතු ය. ඒ සඳහා මහාචාර්ය මද්දුම බණ්ඩාර මහතා යෝජනා කර ඇති පළාත් බෙදීම හෝ වෙනත් සුදුසු බෙදීමක් යොදාගත යුතු ය. එවැනි පළාත් බෙදීමකට අනුව රාජ්‍ය සභාවේ උතුරු පළාත් (යාපාපටුන) සංවර්ධන කමිටුවේ සභාපති බොහෝ විට දෙමළ ජනවර්ගයට අයත්වනු ඇත.

පනස්හයේ දරුවන්ට සන්ධානය වැදගත් වෙයි. එය හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමත් එයට තව තවත් පනස්හයේ දරුවන් එකතුකරගැනීමත් ඔවුන්ගේ වගකීම හා යුතුකම වෙයි. එහෙත් සන්ධානයෙන් සියළු ප්‍රශ්න විසඳේ යැයි බලාපොරොත්තු නොවිය යුතු ය. එය බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවිරෝධි අරගලයේ තවත් වැදගත් පියවරක් පමණකි.

© Prof. Nalin De Silva